**දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

**----------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 15 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජනවාරි 02 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය.

---------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල කඩ කාමර කුලිය තුළ, පසුගිය වර්ෂයට අදාල රු. 52,500 ක් වූ කඩ කාමර කුලී ඇතුළත්වීම නිසා, සමාලෝචිත වර්ෂයේ කඩ කාමර කුලී ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාල වැටුප් ප්‍රතිපූර්ණය තුළ ඇතුළත්, මන්ත්‍රී දීමනා රු. 111,500 ක්, සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස සටහන් නොකිරීම නිසා, වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල වෙළඳ බලපත්‍ර ගාස්තු තුල පසුගිය වර්ෂයන්ට අදාල රු. 11,400 ක හිග වෙළඳ බලපත්‍ර ඇතුලත් වීම නිසා, වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2014 ජනවාරි 23 දින ගෙවන ලද 2013 වර්ෂයේ හතරවන කාර්තුවට අදාල වැටුප්, පරිසර බලපත්‍ර හා බදුකර කුලී ගෙවීම් වෙනුවෙන් වූ මුද්දර ගාස්තු රු. 51,170 ක්, සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත නොවීම නිසා, වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2014 ජනවාරි 10 දින ගෙවීම් කරන ලද දෙහිඅත්තකණ්ඩිය කුළුමං පොම්පාගාරය ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් 2013 නොවැම්බර් මස දීමනා රු. 63,238 ක්, සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත නොවීම හේතුවෙන් වර්ෂයේ වියදම, එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ඔරලෝසු කණුව නඩත්තුව වෙනුවෙන් 2012 වර්ෂය සඳහා ලැබුණු රු. 25,000 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරිම හේතුවෙන් වර්ෂයේ ආදායම, එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වටිනාකම රු. 127,733 ක් වූ ක්ෂේත්‍ර ගබඩා තොගය, යන්ත්‍රෝපකරණ ගිණුමට හර කර තිබීම හේතුවෙන්, යන්ත්‍රෝපකරණ ගිණුමේ අගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සහ කර්මාන්ත ලේඛනයට අනුව 2013 ජනවාරි 01 දිනට පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන එන ලද වටිනාකම රු. 592,934 ක් වු ගෙවිය යුතු ශේෂ 09 ක් ගිණුම්වලට ඇතුළත් කර නොතිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් ගිවිසුම් අත්සන් කර ක්‍රියාත්මක කරන ලද මහ නැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ පෙරසවි ගල් යොදා සකස් කරන ලද වටිනාකම රු. 12,734,662 ක් වූ මාර්ග 26 කට අදාලව ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් කර්මාන්ත ණයගැතියන් සහ කර්මාන්ත ණයහිමියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.

-----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.96,638,216 ක් වූ ගණුදෙනු විගණනයේදී සතටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

**02. මූල්‍ය සමාලෝචනය.**

**--------------------------**

2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,677,272 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,777,905 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

---------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 1,505 | 931 | 1,441 |
| (ii) බදු කුලී | 2,853 | 3,261 | 50 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,049 | 1,275 | 51 |
| (iv) වෙනත් ආදායම් | 465 | 713 | 791 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 689,500 ක උසාවි දඩ මුදල් ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

----------------------------------------------------

සභාව සතු කැබ් රථ 02 ක්, ත්‍රීරෝද රථයක්, කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර 02 ක් හා මාර්ග තලනයක් සමාලෝචිත වර්ෂය තුළ නිෂ්ක්‍රීයව පැවතුණි.

3.2 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ණයහිමි ගිණුමෙන් රු.13,024,205 ක් හා ණයගැති ගිණුමෙන් රු.22,857,268 ක් අනුමැතියකින් තොරව කපා හැර තිබුණි.

3.3 අභ්‍යන්තර විගණනය

-----------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයන්හි සභාව තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි.

4. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ගබඩා පාලනය

(ඈ) ණයගැති හා ණයහිමි පාලනය

(ඉ) වාහන උපයෝජනය